# 'කුමාරි හත්දෙනා දානය' පිළිබඳ මානවවංශවිද්‍යාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඕලුගොල්ලෑව ගම්මානය ඇසුරෙන්)

එච්.බී.එස්.පී. කුමාරිහාමි[1], ජී.එච්.පී.එස්. ලක්මාලි[2]

ප්‍රමුඛ පදඃ සත්පත්තිනි මෑණියන්, කුමාරි හත්දෙනා, මල බුලත් තට්ටුව, මුළුතැන්මුට්ටිය

## හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් අද දක්වාම මානවයා තමාගේ අපේක්ෂාවන් ඉටු කර ගැනීම සඳහා විවිධ ඇදහිලි හා පුද පූජා පැවැත්වීම සිදු කරනු ලබයි. මෙම අපේක්ෂාවන් අතර කලට වෙලාවට අස්වනු ලැබීම, සතුන්ගෙන් බවභෝග ආරක්‍ෂා කර ගැනීමට, ස්වභාවික විපත් අවම වීමට, ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම සඳහාත්, සශ්‍රීකත්වය සහ සෞභාග්‍යය අපේක්ෂා කරමින් විවිධ වූ ශාන්ති කර්ම, බලි තොවිල් ආදිය සිදු කරයි. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා දෙවියන්ට පුද පූජා පැවැත්වීම මූලිකව සිදු කරනු ලබයි. අස්පර්ශිය උරුමයන් අතරට ගැනෙන මෙම විශ්වාස, පුද පූජාවන් සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ දක්නට ලැබේ.

අතීතයේ පටන් මහපොතාන කෝරළයට ආවේණිකව පවත්වන කුමාරි හත්දෙනා දානය ටික්කන්පොතාන තුලානයේ ඕලුගොල්ලෑව ගම්මානයේ තවමත් නොනැසී පවතී. මෙම ශාන්තිකර්මය වැඩිවියට නොපැමිණි ගැහැණු දරුවන් මූලික කර ගනිමින් පවත්වනු ලැබේ. ලෙඩ දුක්, අපල උපද්‍රව දුරු කර අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමටත්, අනාගතය සුබවාදී වීම සඳහාත් සෙත් ශාන්තියක් ප්‍රාර්ථනා කරමින් සත්පත්තිනි මෑණියන් වෙනුවෙන් මෙම කුමාරි හත්දෙනා දානය නම් පූජාව පත්වනු ලැබේ.

ඒ අනුව මෙම පූජාව වැව් ගම්මාන සංස්කෘතියේ විශ්වාස මූලික කර ගනිමින් සිදු කරන ආකාරය අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදුකර ඇත. විවිධ අරමුණු සඳහා නිවාසවල පවත්වනු ලබන කුමාරි හත්දෙනා දානයක් හා සබැඳි පුරාවෘත්තය, එහි සමාජ සංස්කෘතික වැදගත්කම, දානය සිදු කිරීම හා සම්බන්ධ විශේෂිත අවස්ථා අධ්‍යයනය කිරීම, මේ සංස්කෘතිකාංගය නූතනයේ වියැකියාම යටතේ ලේඛන ගත කිරීම.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරීමේදී දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන හා මූලාශ්‍රය පරිශීලනය සිදුකරන ලදී. සම්මුඛ සාකච්ඡා හා පර්යේෂණ වාර්තා දත්ත සංසන්දනය කරමින් විශ්ලේෂණය කිරීමද මෙම පර්යේෂණයේ දී

[1,2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
sewminiprasangika106@gmail.com

සිදු කළේය.

## ප්‍රතිඵල හා සාකච්ඡා

පත්තිනි දේවිය හා සම්බන්ධව කෝවලන්, කන්නගී කතා පුවත කුමාරි හත්දෙනා දානය හා සම්බන්ධ වේ. පඬි රජු අතින් මරණයට පත්වන කෝවලන්ගේ මළ සිරුර ආදාහනය කිරීම සඳහා කන්නගීට සහය වන්නේ එඬේර ගමක වාසය කරන ලද කුඩා දරුවන් පිරිසකි. පසු කන්නගී පත්තිනි දේවිය ලෙස දේවත්වයට පත්වන අතර පෙර උපකාර කළ කුඩා දරුවන්ට පිහිට ආරක්ෂාව ලබා දෙයි. පසුකාලීනව මෙය වැව් ගම්මාන සංස්කෘතිය තුළ කුමාරි හත්දෙනා දානය යනුවෙන් ප්‍රචලිත විය.

ඒ අනුව ඔලුගොල්ලෑව ගම්මානයේ පිහිටි වැව මූලික කරගනිමින් මෙම කුමාරි හත්දෙනා දානය නම් පූජාව පවත්වනු ලැබේ. ඒ සඳහා ප්‍රමුඛ වනුයේ වැඩිවියට පත්නොවූ ගැහැනු දරුවන් හත් දෙනෙකි. කුමාරියන් ලෙස මෙම කුඩා ගැහැනු දරුවන් හත්දෙනාම හඳුන්වනු ලබයි. පොසොන් පොහොය දිනයේ ආරම්භයත් ඇසළ පොහොයේ අවසානයත් අතර කාලය තුළ කෙම්මුර දිනයක මෙම දානය පැවැත්වේ. බොහෝවිට මේ සඳහා යොදා ගැනෙනුයේ සෙනසුරාදා දිනයකි. දානය පැවැත්වීමට මූලිකත්වය ගන්නා නිවසේ කිරි මාතාව විසින් පූජාව පැවැත්වීමට නියමිත දිනයට පෙර දිනයේ සවස අදාළ නිවාසට ගොස් බුලත් දී දානය සඳහා ආරාධනා කර සිටියි. පළමුව ආරාධනා ලබන්නේ වයසින් වැඩිමහල් කුමරියටයි.

උදෑසන කුමාරියන් හත්දෙනා පැමිණි පසු සෙම්බුවකට දමන ලද තම්බාගත් දෙහි, උළුහාල් සහිත මිශ්‍රණය ගල්වා ස්නානය කර පිරිසිදු කරවා ගනී. වැඩිමහල් කුමරිය ස්නානය කළ වැව් මංකඩ සේදීයාමට සෙම්බුවෙන් හත්වරක් පහළට ජලය වත් කරයි. නිවසට ගෙන එන කුමරියන් පෙර සුදානම් කළ ස්ථානයේ හිඳුවා බුලත් හා පුවක් දී ආචාර කරයි. කුමරියන් අසුන්ගන්නා ස්ථානය ඉදිරිපසම කිරි ඉතිරවීමට ලිප, මල බුලත් තට්ටුව හා කිරි ඉතිරුම් මුට්ටිය ආදිය එතැන සූදානම් කරයි. මේ කිරි ඉතිරුම් මුට්ටිය මුළුතැන් මුට්ටිය ලෙස හඳුන්වයි. එය හාල් සේරු හතක් මත රඳවා තබයි. මේ මුළුතැන් මුට්ටිය බුලත් කොළ හතකින් සහ අඹ කොළ හතකින් සරසවා තිබේ. කුමාරි හත්දෙනා දානයට මූලික වන කිරි මව සහ නිවැසියෙක් ගමේ ආසන්න නිවාස හතකට අඹ කොළ දෙකක්, කොහොඹ හා රත්මල් පොකුරක් රැගෙන සම්මාදම් යයි. මෙම ගමනේ දී කිරි මාතාව කිසිවෙකු සමඟ කතාබහ නොකරයි. නැවත නිවසට පැමිණ කිරිබත් පිසීමේ වැඩකටයුතු ආරම්භ කරයි. කිරිබත් දානය සකසන මුළුතැන් මුට්ටිය ලිප මත තැබීමෙන් පසුව කුමාරි හත්දෙනා අතරින් වැඩිමහල් කුමරිය විසින් සහල් මිටවල් තුනක් මුට්ටියට එක් කරන ලැබූ පසු කිරිබත් සෑදීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කර ගනියි. එහිදී ගම්මානයේ වැඩිහිටි මිත්තනියක් මූලික වී සත්පත්තිනි මෑණියන්ට වන්දනා කර ආශිර්වාද පතා දානයට ආරාධනා කරයි. මේ අතර නැවතත් නිවස හිමි කිරිමාතාව විසින් කුමාරියන් හත් දෙනාට බුලත් දී ආචාර කිරීම සිදුකරනු ලබයි.

කිරිබත සකස් කිරීමෙන් අනතුරුව වැඩිමහල් කුමරිය විසින් පරහත ගෑම සිදු කරයි. පරහත යනු රත්හඳුන් සිසිල් පැන් හා මුසු කර උරච්චි කිරීමෙන් සාදාගන්නා ආලේපයකි. එම ආලේපය ඇඟිලි තුඩින් ගෙන නළලත තිලකයක් ලෙස තබයි. පළමුව වැඩිමහල් කුමරිය විසින් තමා ඇතුළු අනෙකුත් කුමාරියන්ගෙ නළලත පරහත ආලේපයෙන් අනතුරුව පිළිවෙළින් නිවසේ සිටින කුඩා දරුවන්ගෙත් දානයට සම්බන්ධ වී සිටින අනෙක් පිරිසගේත් පරහත ආලේප කරයි.

අනතුරුව බිම අසුන්ගෙන සිටින කුමාරියන් හත් දෙනාට සුදු පැහැ පත්කඩක් ලබා දී නිවසේ කිරිමාතාව විසින් තුන් වරක් කිරිබත් දානය පිළිගන්වා අනුභව කිරීමට පෙර කුමාරියන් හත්දෙනාගෙන් වෙන වෙනම කිරිබත් කොටසක් එකතු කරගනු ලබයි. මෙය හඳුන්බත නම් වේ. මෙසේ එකතු කරගන්නා හඳුන්බත රැස්ව සිටින සියලුම දෙනාට වැඩිහිටි කුමරිය විසින් පිළිගන්වයි. කුමරියන් කිරිබත් අනුභව කිරීමෙන් පසු මල බුලත් තට්ටුව කුමාරියන් සත්දෙනා අතර සමානව බෙදා දෙනු ලබයි. මල බුලත් තට්ටුව බුලත් හතකින් සහ පුවක් හතකින් පිළියෙල කරයි. දානය අවසන් වන විට කුමාරි සත්දෙනාටම බුලත් හතක් සහ පුවක් හතක් දී තුන් වරක් ආචාර කර තිබිය යුතුය. අනතුරුව කිරිබත් මුල් බැඳ දී කුමාරියන් නිවසින් පිටත් කිරීමෙන් කුමාරි හත්දෙනා දානයේ වත්පිළිවෙත් අවසන් වෙයි.

**සමාලෝචනය**

අස්පර්ශිත උරුම අතරට ගැනෙන මෙම කුමාරි හත්දෙනා දානය වර්තමානය වන විට ගම්වාසීන් අතරින් තුරන් වෙමින් පවතී. මේ සඳහා නූතන අධ්‍යාපන රටාව, කුඩා පවුල් නිර්මාණය වීම, ගම් අත්හැර නගරාශ්‍රිත පදිංචියට යාම හා නූතන පරම්පරාවන් මේ පුදපූජාවන් විශ්වාස නොකිරීම ආදිය හේතු වී තිබේ. වැව හා බැඳුණු මෙම අගනා සිංහල බෞද්ධ ජනයා අතර පවතින මෙවන් සංස්කෘතික අභිචාර අනාගත පරම්පරාවට දායාද කිරීමටත්, පරම්පරාවෙන් පැවත එන මෙම සම්ප්‍රදායන් ලේඛනගත කර සුරක්ෂිත කිරීමත් සිදුකළ හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

චන්දන, ඔරුක්මාන්කුලමේ. ***හුරුලු මංගල්‍යය.*** (1997). රත්මලානඃ පෙතිකඩ ප්‍රකාශන භාරය හා මුද්‍රණාගාරය.

**සම්මුඛ සාකච්ඡා**

හේරත්,රම්‍යා. කුමාරි, එච්.එම්. (2025). කුමාරි හත්දෙනා දානය පිළිබඳව. එච්.බී.එස්.පී කුමාරිහාමි, 2025/07/19

රත්මැණිකේ, ඩී.එම්, (2025). කුමාරි හත්දෙනා දානය පිළිබඳව. එච්.බී.එස්.පී කුමාරිහාමි, 2025/07/20